බලශක්ති අමාත්‍යාංශය

# පුරප්පාඩු දැන්වීම

## අධ්‍යක්ෂ ජනරාල් / ප්‍රධාන විධායක නිලධාරී තනතුර

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ නියැළී සිටින ඉහළම ජාතික ආයතනයට නායකත්වය දෙමින් දේශගුණික විපර්යාස ව්‍යසනයෙන් පෘථිවිය බේරා ගැනීමේ අපගේ සටනේදී බලශක්ති සංක්‍රාන්තිය මෙහෙයවන ඉහළ මට්ටමේ වෘත්තිකයන් කණ්ඩායමකට සම්බන්ධවීමට අවස්ථාව සැලසේ.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පත්වීම් සිදු කරනු ලබන්නේ රජය විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයන් යටතේ කොන්ත්‍රාත් පදනම මත වේ.

**සන්දර්භය**

2007 ඔක්තෝබර් 01 වන දින සිය ගමන ආරම්භ කළ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය තුළ පුළුල් සහ දිගුකාලීන බලපෑමක් ඇති කර තිබේ. බලශක්ති කළමනාකරණය සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය යන ද්විත්ව අරමුණු යටතේ ක්‍රියාත්මක වන අප, ජෛව ස්කන්ධ, ජලවිදුලි, සූර්ය සහ සුළං යන භාවිතයට නොගත් ස්වාභාවික බලශක්ති සම්පත් ඵලදායී වාණිජමය භාවිතයට ගෙන ඒමට නායකත්වය දී ඇති අතර, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයේ පුළුල් විෂය පථය ආවරණය කරමින් සහ වාණිජ, කාර්මික, ගෘහස්ථ සහ ප්‍රවාහන අංශවල සියලුම ආර්ථික ක්‍රියාදාමයන් තුළ බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට ද නායකත්වය දී ඇත. ඉලක්කගත අපේක්ෂාවන් ඉක්මවා යමින්2015 වසරේදී ඉලක්කගත දිනට වසරකට පෙර, ජාතික විදුලි සැපයුමෙන් 10% ක ප්‍රමාණයක් නව පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් දායකත්වය ලබා දීමට අධිකාරිය සමත් වූ අතර 2024 වසරේදී විදුලි සැපයුමෙන්55% ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් සාක්ෂාත් කර ගැනීමට හැකි විය. අධිකාරිය විසින් දියත් කළ වැඩසටහන් අතුරින් ක්ෂේත්‍රයේ දැවැන්ත පෙරළියක් සිදු කළ සූර්යබල සංග්‍රාමය වැඩසටහන මඟින් දහස් ගණන් විදුලි භාවිතා කරන්නන් විදුලි නිෂ්පාදකයින් බවට පත්කරන ලදී. බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ප්‍රයත්නයේ දී, අධිකාරිය විසින් බොහෝ විදුලි උපකරණ බලශක්ති ලේබල් කිරීමේ ක්‍රියාවලිය යටතට ගෙන ඒම අඛණ්ඩව සිදු කරන අතර සියලුම වැදගත් අංශ බලශක්ති මිනුම් සලකුණු වැඩසටහන යටතට ගෙන ඒමේ ඉදිරි ගමනක යෙදී සිටී. බලශක්ති කාර්යක්ෂමතා ගොඩනැගිලි නීති සංග්‍රහයක් බලාත්මක කිරීමට ද පියවර ගෙන ඇත.

ශ්‍රී ලංකාව බලශක්ති සුරක්ෂිත අනාගතයකට ගෙන යාමේ උත්සාහයේ දී, පාසල් දරුවන්ගේ සිට පශ්චාත් උපාධි පර්යේෂකයින් දක්වා පුරවැසියන්ට බලශක්ති දත්ත, තොරතුරු සහ දැනුම සඳහා අත්‍යවශ්‍ය මූලාශ්‍ර සපයා ඇත. ජාතික මට්ටමේ බලශක්ති දත්ත ගණනය කිරීමේ බලධාරියා ලෙස, අධිකාරිය ශ්‍රී ලංකා බලශක්ති තුලනය වාර්ෂිකව ප්‍රකාශයට පත්කරයි.

2050 වසරේදී කාබන් ශුන්‍යතාවය කරා ළඟා වීමේ ක්‍රියාදාමය තුළ බලශක්ති අංශය තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා පදනම සකස් කරමින්, බලශක්ති අංශයට ඇමරිකානු ඩොලර් බිලියන දෙකකට ආසන්න ආයෝජන බලමුලු ගැන්වීමට අධිකාරිය විසින් අවස්ථාව උදාකර ඇත.

**කාර්යභාරය**

අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයා, පරිපාලන හා මූල්‍ය කටයුතු ඇතුළුව අධිකාරියේ සියලු කටයුතු සඳහා වගකිව යුතු අතර, සුනිත්‍ය බලශක්ති ක්ෂේත්‍රයේ ජාතික මට්ටමේ සන්ධිස්ථාන ළඟා කර ගැනීම සඳහා අධිකාරියේ සියලුම කාර්ය මණ්ඩලයට නායකත්වය සහ දිරිගැන්වීම ලබා දෙනු ඇත. ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයට උපදෙස් දීම ඔහු / ඇයගෙන් අපේක්ෂා කරන අතර අධිකාරියේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය අරමුදල් සහ සම්පත් ලබා ගැනීම සඳහා වගකිව යුතු වේ. එමෙන්ම ඔහු/ඇය අවශ්‍ය අවස්ථාවලදී රේඛීය අමාත්‍යංශය සහ අනෙකුත් රජයේ ආයතන සමග සන්නිවේදනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා කේන්ද්‍රීය නිලධාරියා වනු ඇත . පනතේ දක්වා ඇති පරිදි රටේ සුනිත්‍ය බලශක්ති ඉලක්ක සපුරා ගැනීම සඳහා වැඩසටහන් තෝරා ගැනීම, කාර්යයන් ඉටු කිරීම, බලතල ක්‍රියාත්මක කිරීම සහ වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් උපායමාර්ගික තීරණ ගැනීම සඳහා ඔහු / ඇය වගකිව යුතුවේ. කළමනාකරණ මණ්ඩලයේ ප්‍රධාන මග පෙන්වීම සහ පාලනය යටතේ කටයුතු කරමින්, පනතේ දක්වා ඇති අභිමතාර්ථයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරායගෙන් අපේක්ෂා කෙරේ . පනතේ අදාළ විධිවිධාන හරහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට පවරා ඇති නිශ්චිත වගකීම් සම්බන්ධව ද ඔහු / ඇය වගකිව යුතුවේ.

## අධ්‍යක්ෂ ජනරාල් තනතුරට බඳවා ගැනීම

**සුදුසුකම් :** (පහත 1 හෝ2 )

**බාහිර අයදුම්කරුවන් සඳහා**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදුලි /යාන්ත්‍රික /ක්‍රියාවලි හා නිෂ්පාදන හෝ බලශක්තියට අදාළ ක්ෂේත්‍රවල ඉංජිනේරු උපාධියක් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයක්.

   **සමග**

   ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු) හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය.

   **සහ**

   පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සාර්ථක සේවාවක් ඇසුරෙන් වූ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 20 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවුරුදු 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් විය යුතුය.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදුලි/යාන්ත්‍රික/ ක්‍රියාවලි හා නිෂ්පාදන හෝ බලශක්තියට අදාළ ක්ෂේත්‍රවල ඉංජිනේරු උපාධිය.

   **සහ**

   අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය.

   **සහ**

   ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු සංස්ථාවක, මණ්ඩලයක, උසස් අධ්‍යාපන ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක සාර්ථක සේවාවක් ඇසුරෙන් වූ කළමනාකරණ පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර**

ඉහත බාහිර අධ්‍යාපන සුදුසුකම් සහිත නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(HM 2-1) ලෙස වසර දෙකක (02) පළපුරුද්ද.

**වයස් සීමාව**

අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප් සහ දීමනා**

මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය පහත දැක්වේ.

**වැටුප් පරිමාණය :** HM -2-3- රු.173,000-12X4,850- රු.231,200

**චක්‍රලේඛ 01/2025 : අනුව 2026.01.01 , සිට රු150,325 . ක් සහ 2027.01.01 සිට රු173,000 . දක්වා ගෙවනු ලැබේ. කෙසේ වෙතත් ,කළමනාකරණ මණ්ඩලය සමඟ සාකච්ඡා කර මෙම තනතුරට අදාළ වන වේතනය අමාත්‍යවරයාට තීරණය කළ හැකිය.**

**අනෙකුත් දීමනා :**

- ජීවන වියදම - රු17,800.
- වෘත්තීය දීමනාව - රු25,000.
- ජංගම දුරකථන දීමනාව - රු4,250.
- අදාළ මාසයේ 01 වන දිනට පවතින ඉන්ධන මිල මත පදනම්ව ගණනය කරනු ලබන ,මසකට ඉන්ධන ලීටර් 145 කට සමාන මුදලක්.
- වාහන දීමනාව :ආයතනය විසින් නඩත්තු කරනු ලබන වාහනයක් හෝ රු50,000 . ක මාසික දීමනාවක්

***ඉල්ලුම් කළ යුතු ආකාරය :***

ඥාතින් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනය සහ දුරකථන අංක සහිත ජීව දත්ත පත්‍රිකා ඇතුළත් අයදුම්පත් ,අදාළ සියලු සහතිකවල සහතික කළ පිටපත් සමග 2026 ජනවාරි 23 වන දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, අංක 80, අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ලිවිය යුතුය.

රජයේ සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල /රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් සලකා බැලීමට නම්, එම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් හරහා ඉදිරිපත් කළ යුතුය.

**සභාපති**
**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
**අංක 80, අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.**
**2026.01.05**

**A Sustainable and Energy Secure Sri Lanka**